## සියවසක නුවණ බිම

**ශ්‍රීනාත් ගණේවත්ත සූරීහු**

1 සොඳුරු බුදු සසුන් රැක්මේ රිසින් දෙව් ලොවින් වන්
සිදුරු නැති පැවැත්මෙන්, සත් ගුණෙන්, දම් නැණින් දුල්
**විදුරුනැණ**’බිඳන් මා නා සමින්දන් **පැළෑණේ**
විදුරු අරම නංවා ලක් සසුන් කෙත් වවද්දී

2 පවර මැතිසඳුන් **ජේ. ජී. ද සිල්වා** උදව්වෙන්
මහරු මිණි රුවන් වන් ගත් දෙ දාසක් තමන් ගේ
සතිර වැ කොටැ තැන්පත් සැදවූ පොත් ගුල යි මේ
සපිරි සියවසින් කිත් රැව් නඟා දැන් බෙජෙන්නේ

3 **පැනසිහි** ද **රහල්** බෝසත් **මෙතේ නාරදත්** ඈ
**පියදසි මහනම්** හා **සෝම, කේමින්ද** වන් ඒ
උතුරුතර තෙරුන් ගේ දම් පහන් ලෝ නඟාලූ
නොසම දැනුමැ උල්පත් පෑදැවූ පොත් ගුල යි මේ

4 **කුමරතුඟු** ද **දොන් බාරොන්, විකුම්සී ද සිල්වා**
සහ **පරණවිතානෑ**’ සත් නැඟූ කිත් වියත් තැන්
පැමිණි කලැ පැළෑණේ නා සමින්දන් දැකුම් වස්
පල ලද අයුරුත් මින් සක් සුදක් සේ පෙනී යේ.

5 සුදුසු කොටැ දහම් පාදා හෙළා ඊ සදොස් තැන්
හරය මතු කිරීමේ ලා සියත් වූ වෙසෙස් බව්
විදුරරමැ හිමින් ගෙන් දැක්විණැ යි විද්දනෝ යෙත්
එයට ද සවි අත්වැල් පොත් ගුලෙන් මේ ලැබූයේ

6 **අනඳ** නියමුවාණන් ගේ සුදැක්මෙන් නැඟී ඔප්
දහම පෙරට වූ නන් සත් දැනුම් මං උදුල්වා
බුදුනු නැණ ලොවේ දැන් රන් කොතක් සේ සුදිස්නා
විදුරරමැ මෙ පොත් ගුල් පන්දහස් වස් බෙජේ වා!